ගංවතුර ආපදා සඳහා සහන සැලසීමේ ව්‍යාපෘතිය 2011

---------------------------------------------------------------------------

1. මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව , මාගේ මතය වනුයේ,

(අ) 2011 පෙබරවාරි 18 සිට අගෝස්තු 17 දක්වා කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2011 අගෝස්තු 17 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ප්‍රදාන ගිවිසුමෙහි නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව සහ

(ඈ) ප්‍රදාන ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2. මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 මූල්‍ය කාර්ය සාධනය

------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2011 පෙබරවාරි 18 දින සිට 2011 අගෝස්තු 17 දක්වා කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතියේ වියදම රු.331,167,300 ක් විය. සමාලෝචිත මාස හයක කාලපරිච්ඡේදය සඳහා වියදම පිළබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම | 2011 පෙබරවාරි 18 සිට අගෝස්තු 17 දක්වා කාල පරිච්ඡේදය සඳහා වියදම | |
|---|---|---|
| | ශ්‍රී.ලං.රු. | එ.ජ.ඩොලර් |
| ආහාර, බෝතල් කළ පානීය ජලය සහ පෞද්ගලික ස්වස්ථා උපකරණ කට්ටල | 73,598,927 | 666,722.77 |
| "වැඩ සඳහා" මුදල් | 257,568,373 | 2,333,277.23 |
| එකතුව | 331,167,300 | 3,000,000.00 |

**3. විගණන නිරීක්ෂණ**

පහත නිරීක්ෂණයන් කරන ලැබේ.

ගංවතුර සහ නාය යෑම්වලට ලක්වූ දිස්ත්‍රික 07 හි අවතැන් වූ ජනතාවට සහන සැලසීම වෙනුවෙන් රු.331,167,300 ක් වූ අරමුදල් පහත දක්වා ඇති සහන ක්‍රියාකාරකම් හතර වෙනුවෙන් දරා තිබුණි.

(i) ආහාර සලාක, බෝතල් කල පානීය ජලය, වෛද්‍ය උපකරණ සහ පෞද්ගලික ස්වස්ථා උපකරණ
(ii) ජල පවිත්‍රකරණ සහ සනීපාරක්ෂක උපකරණ මිලදී ගැනීම.
(iii) තාවකාලික කුඩාරම්, පන්ති කාමර සහ ඉගැන්වීම් උපකරණ
(iv) අපද්‍රව්‍ය ඉවත් කිරීම සහ පිරිසිදු කිරීම

සහන ක්‍රියාකාරකම් ආපදාවන්ට ලක්වූ දිස්ත්‍රික්ක 05 තුළ ක්‍රියාත්මක කිරීමේදී ක්‍රියාකාරකම් අංක 01 සහ "වැඩ සඳහා මුදල" නව ක්‍රියාකාරකම් වෙනුවෙන් ආසියානු සංවර්ධන බැංකු එකඟතාවය මත රු.257,568,373 වියදමක් දරා තිබූ අතර එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 77.77 ක් විය.